# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2315/24 - 2023 ජනවාරි මස 18 වැනි බදාදා - **2023.01.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : DIK/LAN/02/61.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කර ඇති බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන *ඉඩමේ/පරවශතාවේ විස්තර :*

මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 452ඒ, වැවුරුකන්නල ග්‍රාම නිලධාරි වසමේ, වැවුරුකන්නල ගමේ පිහිටි මාතර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අංක මූ.පි. මාර 2905 දරන මූලික පිඹුරේ පෙන්වා ඇති පහත සඳහන් බිම් කොටස්.

01. **කැබලි අංක 01**
ඉඩමේ නම : ගුලුගහවත්ත *හෙවත්* දන්ගහවත්ත; විස්තරය: මාර්ගය; හිමිකම් කියන්නා: පී.ඩී.පී. මුතුකුමාරණ, වැවුරුකන්නල, දික්වැල්ල, පී.ඒ.එම්. මුතුකුමාරණ, "සුදුවළා", දඹගස්ආර, දෙමටපිටිය; භූමි ප්‍රමාණය : හෙක්ටයාර් 0.0071

02. **කැබලි අංක 02**
ඉඩමේ නම : ගුලුගහවත්ත *හෙවත්* දන්ගහවත්ත; විස්තරය: ළඳු කැලෑව; හිමිකම් කියන්නා: පී.ඩී.පී. මුතුකුමාරණ, වැවුරුකන්නල, දික්වැල්ල, පී.ඒ.එම්. මුතුකුමාරණ, "සුදුවළා", දඹගස්ආර, දෙමටපිටිය; භූමි ප්‍රමාණය : හෙක්ටයාර් 0.5583

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 පෙබරවාරි මස 19 වැනි දින පෙ.ව. 10.30ට දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2023 පෙබරවාරි මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම්/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත්, එකී *ඉඩම්/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා එය ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**සුසන්ත අත්තනායක,**
ප්‍රාදේශීය ලේකම්,
දික්වැල්ල.

2023 ජනවාරි මස 12 වැනි දින,
දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01-0188

1A - G 38618 – 14 (2023/01)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*